# නියමිත කලට අලුත්වැඩියා කිරීමෙන් වාහනයත් ඔබේ මුදල් පසුම්බියත් ආරක්ෂා වේ



**වාහන හිමිකරුවෙක් වශයෙන් ඔබ, ඔබගේ වාහනය පිළිබඳව සහ නියමිත කලට සිදුකළ යුතු අලුත්වැඩියාවන් පිළිබඳව දැනුවත්ද? ඒ දැනුවත්භාවය අවම වශයෙන් පවතින වාහන හිමියන් සඳහායි මේ ලිපියෙන් ආමන්ත්‍රණය කරන්නේ. දශකයකට ආසන්න කාලයක් පුරා වාහන සේවා සැපයුම් ක්ෂෙත්‍රය හා බැඳි කීර්තිමත් නාමයක් වන ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගමේ නියෝජිතයෙක් සමඟ ඒ පිළිබඳව සිදුකළ සාකච්ඡාවක් පහතින් දිගහැරේ.**

**වාහනයක් මිලදී ගැනීමේදී වාහනයේ තත්ත්වය සහ නීතිමය වාතාවරණයක් යටතේ වාහනය මිලදී ගන්නවා හැරෙන්නට සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?**

බොහෝ පිරිස් තමන්ගේ අතේ රැඳි මුළු මුදලම යොදවල එහෙමත් නැත්නම් ණය හෝ ලීසිං පහසුකම් ලබා ගනිමින් තම ප්‍රියතම වාහනය මිලදී ගන්නවා. නමුත් ඒ වාහනය මිලදී ගත්තායින් පසුව එන අලුත්වැඩියාවන් සඳහා මුදල් අවශ්‍ය බව පිළිබඳ ඔවුන්ට දැනුවත්භාවයක් නැහැ. සාමාන්‍යයෙන් අලුත්ම වාහනයක් මිලදී ගත් පසුව 50,000km, 1,00000km ඉක්මවූවායින් පසුව අනිවාර්ය නඩත්තු අවස්ථා පැමිණෙනවා. ඒ සඳහාත් යම් මුදලක් වෙන් කර තබා ගැනීම වාහන හිමියෙක් ලෙස ඔබට වැදගත් වෙනවා. ඒ වගේම තම වාහනය පිළිබඳව වාහන හිමිකරුට වඩාත් නිවැරදි දැනුවත්භාවයක් තිබිය යුතුමයි. ඒ දැනුවත්භාවය කාන්තා, පුරුෂ භේදයකින් තොරව සෑම වාහන හිමියෙක්ටම පැවතිය යුතු වෙනවා.

**වාහනයක හිමිකරුවෙක් තම වාහනයේ නඩත්තු කටයුතු පිළිබඳව දැනගත යුතු මූලික කරුණු මොනවාද?**

සාමාන්‍යයෙන් ඕනෑම වාහනයක් මිලදී ගන්නා පුද්ගලයෙක්හට තම වාහනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇති දැනුවත්භාවයම තම වාහනයේ නඩත්තු කටයුතු පිළිබඳවත් පැවතිය යුතුයි. නමුත් අපගේ සේවා මධ්‍යස්ථාන වෙත පළමුවරට පිවිසෙන පාරිභෝගිකයන් බොහොමයකට ඒ පිළිබඳ මූලික දැනුවත්භාවය නැහැ. බොහෝ වාහන හිමියන් දන්නේ සෑම පූර්ණ සේවාවකදීම වාහනයේ ඔයිල් ෆිල්ටර් එක මාරුකළ යුතු බව පමණයි. ඒ නිසයි ඔවුන් තම වාහනය සර්විස් කරන්නට සේවා මධ්‍යස්ථාන වෙත ගෙන යන්නේ. නමුත් වාහනයක හිමිකරුවෙක්ට ඒ දැනුම ප්‍රමාණවත් වන්නේ නැහැ.

වාහන මාදිලිය අනුව, වාහනයක Engine Oil සහ Engine Oil Filter එක සෑම 5000km හෝ 10000km වරක් මාරු කළ යුතු වෙනවා. එසේම Brake සහ Tyres and Inflation Pressure එක, Engine Coolant පරීක්ෂා කිරීම සහ මාරු කිරීම පිළිවෙළින් සිදු කළ යුතුයි. වාහනයේ ධාවනය අනුව Spark Plugs මාරු කිරීම අවශ්‍ය වෙනවා. වාහනයේ එන්ජිමට දූවිලිවලින් සහ වෙනත් අපද්‍රව්‍යවලින් සිදුවන හානිය වළකාලන Air Cleaner Filter පරීක්ෂා කර අවශ්‍ය නම් මාරු කිරීම සිදු කළ යුතුයි. එමෙන්ම නිසි කාලයේදී වාහනයේ Fuel Filter එක Manual හෝ Automatic Transmission Oil සහ Differential Gear Oil මාරු කළ යුතු වෙනවා. මීට අමතරව Power Steering Fluid සහ Brake Fluid පරීක්ෂා කිරීම සහ අවශ්‍ය නම් මාරු කිරීම සිදු කළ යුතුයි.

ඔබ වාහන හිමියෙක් නම් ඉහත කී කරුණු සම්බන්ධයෙන් ඔබ සතුව මූලික දැනුමක් තිබීම අත්‍යවශ්‍ය වනවා. එපමණක් නොවේ, අද නිපදවන බොහෝ නවීන වාහනවල ඉලෙක්ට්‍රොනික උපාංග බහුල වශයෙන් තිබෙන නිසා කාර්මික



දෝෂ ඇතිවන අවස්ථාවන් වලදී Dashboard එකේ පෙන්වන Indicators පිළිබඳව දැනුමක් ඇතිකර ගැනීම වැදගත්.

**අනෙකුත් වාහන සඳහා පවතින සේවා මධ්‍යස්ථාන හා සසඳන විට Sterling Aftercare Centre හි විශේෂත්වයන් මොනවාද?**

Sterling Aftercare Centre

අපගේ වගකීම වන්නේ පාරිභෝගිකයින්ගේ වටිනා වාහනයට අවශ්‍ය සේවාවන් ගුණාත්මක අයුරින් පිරිනැමීමයි. Sterling Aftercare Centre හිදී ක්‍රමානුකූල සැලසුම් සහගත බවකින් යුතුව ඔබේ වාහනයට අවශ්‍ය සේවා ලබා දීමට අප කටයුතු කරනවා. ඒ වගේම Sterling අපි පමණයි අපගේ සේවා මධ්‍යස්ථාන කරා ගෙන එන වාහනවල Engine Scan එකක් සිදු කරන්නේ. වාහනයේ එන්ජිම සම්බන්ධව සිදුකළ යුතු අලුත්වැඩියාවන් ඒ Scan එකෙන් හඳුනාගන්නට පුළුවන්. ඒ අනුව හඳුනා ගන්නා ගැටලු සහ ඒවාට පවතින විසඳුම් පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම අපගේ සේවා උපදේශකවරයන් (Service Advisers) විසින් සිදු කරනවා. ලංකාවේ වෙනත් කිසිදු සේවා මධ්‍යස්ථානයන්හිදී Service කිරීමක් සඳහා යොමු කරන වාහනවල Engine Scan එකක් සිදුකරන්නේ නැහැ. ඒ නිසා වෙනත් සේවා මධ්‍යස්ථාන සමඟ සසඳන විට Sterling Aftercare Centre හිදී ඔබේ වාහනය පිළිබඳ පූර්ණ පරීක්ෂාවක් සිදුකිරීම විශේෂයි.

අපගේ සේවා මධ්‍යස්ථාන වෙත පිවිසෙන පාරිභෝගිකයන් සඳහා සේවා උපදේශකවරුන් ඔස්සේ වාහනයට හිතකර සහ අහිතකර තත්ත්ව, වාහනයේ අමතර උපාංග, වාහනයේ නඩත්තුව, වාහන හිමිකරුවෙක් ලෙස ඔබ දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත්භාවය ලබා දීමට අප කටයුතු සම්පාදනය කර තිබෙනවා. මෙහි පවතින විශේෂත්වය වන්නේ ඔබගේ වාහනය අපගේ සේවා ස්ථානයට ඇතුළත් කළ අවස්ථාවේ පටන් ඔබේ වාහනය සඳහාම විශේෂ වූ සේවා උපදේශකවරයෙක් වෙන්ව කටයුතු කිරීමයි.

**වාහනයක එංජින් පරීක්ෂාවක් සිදු කිරීමේ වැදගත්කම පැහැදිලි කළොත්...**

වාහනවල පවතින දෝශ සහ නියමිත කලට සිදු කළ යුතු අලුත්වැඩියාවන් පිළිබඳ දැනුවත් වීමෙන් විශාල මුදලක් වැය කරන අලුත්වැඩියාවන් වළක්වා ගත හැකියි. ඇතැම් අවස්ථාවලදී වාහන හිමිකරුගේ නොදැනුවත්භාවය නිසා වාහනයේ උපාංග කිහිපයක් ඇතුළත් කොටසක්ම මාරු කිරීමේ අවශ්‍යතාව ඇති වෙනවා. නමුත් Sterling Aftercare Centre වෙත නඩත්තු සහ සේවා අවශ්‍යතා සඳහා රැගෙන එන වාහනවල Engine Scan එකක් සිදුකරන නිසා ඉදිරියේදී සිදු කළ යුතු අලුත්වැඩියාවන් පිළිබඳව පාරිභෝගිකයන්ව දැනුවත් කළ හැකියි. හයිබ්‍රිඩ් වාහනවල බහුල වශයෙන් පවතින්නේ සංවේදීතාවයෙන් වැඩි ඉලෙක්ට්‍රොනික උපාංගයි. හයිබ්‍රිඩ් වාහනයක අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතු කාලය තීරණය වන්නේ වාහනය පදවන්නා සහ වාහනය පාවිච්චි කරන ආකාරය මතයි. ඒ නිසා හයිබ්‍රිඩ් වාහනයකට Engine Scan එකක දැඩි අවශ්‍යතාවක් පවතිනවා. හයිබ්‍රිඩ් වාහන පදවන්නන් මේ පිළිබඳව සැලකිලිමත් විය යුතුයි.

**වාහනයක් පණ ගැන්වීමට ප්‍රථමයෙන් සහ වාහනයේ ක්‍රියාකාරීත්වය අඩපණ වූ විටකදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?**

රේඩියේටර් එක උණුසුම් වීම හැරෙන්නට වාහනයක ක්‍රියාකාරීත්වය අඩපණ වූ විට බොනට් එක හැර Radiator Coolant හෝ ජලය නියමිත පරිමාණයට පවතිනවාද යන්න නිරීක්ෂණය කළ යුතුය. Engine Oil නියමිත පරිමාණයෙන් පවතිනවාද යන්න සහ Engine Oil වල පැහැයත් නිරීක්ෂණය කරන්න පුළුවන්. වාහනයක බැටරිය සහ ටයර නිරීක්ෂණය කිරීමෙන්ද ක්‍රියාකාරීත්වය අඩපණ වීමට හේතුව සොයාගත හැකියි.

වාහනයක් පණ ගැන්වීමට ප්‍රථමයෙන් විශේෂයෙන්ම දුර ගමනක් යන්නට සූදානම් වනවා නම් වාහනයේ Coolant, Oil සහ තිරිංග පද්ධතිය පරීක්ෂා කර බැලීම පුරුද්දක් කර ගැනීම වටිනවා.

**Sterling Aftercare Guarantee වගකීම් සහතිකය ලැබූ වාහනයක හිමිකරුවෙකු වීමෙන් පාරිභෝගිකයින්ට අත්විඳිය හැකි සුවිශේෂී ප්‍රතිලාභ මොනවාද?**

Sterling Aftercare Guarantee වගකීම් සහතික ලැබූ වාහන සඳහා වගකීම් කාලසීමාව ඇතුළත වැඩ කුලී රහිත Service අවස්ථාවන් 05ක් පාරිභෝගිකයින් වෙත අප ආයතනය පිරිනමනවා. එම සේවා වාර 05 අපගේ ඕනෑම ශාඛාවකින් ලබා ගැනීමට පුළුවන්. එහිදී පාරිභෝගිකයාට වියදම් දැරීමට සිදු වන්නේ වාහනය සඳහා යොදන ලිහිසි තෙල් (Lubricants) වර්ග සඳහා පමණි. ඒ වගේම වගකීම් කාලය ඇතුළදී ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකයට ඇතුළත් නිකුත් කරන ඔබගේ වාහනයේ උපාංග අලුත්වැඩියා කිරීම හෝ නැවත එක් කිරීම (Replace) ද අප සිදු කරනවා. නමුත් එහිදී වාහනයේ හිමිකරු නිවැරදි ලෙස වාහනය පරිහරණය කර තිබීම අත්‍යවශ්‍ය කොන්දේසියක් ලෙස සලකනවා.

ඔස්සේ පැකේජ ක්‍රමය යටතේ නඩත්තු සහ සේවා ලබාදීමේ පහසුකම හඳුන්වා දෙන්නට නියමිතයි. එය ආයතනයේ වාහන ප්‍රමාණය සහ අවශ්‍යතාව මත සාකච්ඡා කර ගැනීමේ හැකියාවත් පවතිනවා. ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථාන මහර -කඩවත, උඩහමුල්ල - නුගේගොඩ, දූනගහ - මිනුවන්ගොඩ සහ ගාල්ල යන ප්‍රදේශයන්හි ස්ථාපිත කර තිබෙනවා. ඊට අමතරව ඔයිල් වර්ග හුවමාරු කිරීම සහ අමතර උපාංග සඳහාම විශේෂිත වූ ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථානයක් නාරාහේන්පිට පිහිටුවා තිබෙනවා. ඒ වගේම 2020 වන විට නව Sterling Aftercare සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන්නටත් අරමුණු කරගෙන සිටිනවා.



Sterling After care වගකීම් සහතිකය ලැබූ හෝ නොලැබූ ඕනෑම වාහනයක් Service කිරීමට හෝ අලුත්වැඩියා කටයුත්තක් සඳහා අප මධ්‍යස්ථාන කරා රැගෙන යාමට බලාපොරොත්තුවනවා නම් පාරිභෝගිකයන් පළමුව සිදු කළ යුත්තේ, 0117 600 800 ඔස්සේ අපගේ පාරිභෝගික සේවා කණ්ඩායම අමතා වාහනය අප පද්ධතියෙහි ලියාපදිංචි කිරීමයි. එහිදී ඔබට පැමිණීමට පහසු අපගේ සේවා මධ්‍යස්ථානය සඳහන් කර එහි වෙන්කර ගැනීමක් සිදු කළ යුතුයි. හදිසියේ වාහනයේ ක්‍රියාකාරීත්වය අඩපණ වූ විටකදී පැය 24පුරා ක්‍රියාත්මක Roadside Assistance Service ඇමතීමෙන් ඔබට අවශ්‍ය උපදෙස් හෝ සේවා ලබා ගත හැකියි.

එළඹෙන පෙබරවාරි මස සිට විශාල වාහන සංඛ්‍යාවක් පවතින සමාගම් සඳහා ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථාන

**අවසාන වශයෙන් වාහන හිමිකරුවන්ට ලබා දෙන පණිවුඩය කුමක්ද?**

වාහනයක් මිලදී ගැනීමේදී වාහනය සම්බන්ධව ඉදිරි කාලය තුළ පැන නැඟිය හැකි අලුත්වැඩියාවන් පිළිබඳව සිහියේ තබා ගනිමින් තමන්ට අලුත්වැඩියා කිරීමේ හැකියාව පවතින වාහනයක් මිලට ගැනීමට යොමු වන්න. ඒ වගේම වාහනයක් පදවන්නෙක් ලෙස තම වාහනයේ නියමිත කලට සිදුවිය යුතු අලුත්වැඩියාවන් පිළිබඳව යම් තරමකින්වත් දැනුවත් වන්න. එසේම ඒ අලුත්වැඩියා සහ සේවා කටයුතු සිදු කරගැනීමට වගකිවයුතු ආයතනයක් වෙත යොමු වන්න.

**හෂිනි ඉරේෂා ගුණවර්ධන**


